•

# අම්බලන්තොට බෝදලකන්ද ගෙඩි වණ පිළිකා වෙදකමෙහි අනන්‍යතාවය

පාරම්පරික වෛද්‍ය සී. ඩබ්. කොඩිතුවක්කු

වසර දෙසීයකට වඩා පැරණි වෙද පරපුරෙක මා හතර වන පුරුක නියෝජනය කරන අතර දැනට මා මාතර බෙලි අත්ත රෝහලේ ගෙඩි වන පිළිකා විශේෂ වෛද්‍යවරයා ලෙස කටයුතු කරමි. ශල්‍ය කර්ම සිදු කිරීමට අපහසු මර්මස්ථාන ආදිය ආශ්‍රිත ව ඇතිවන ගෙඩි ආදිය ප්‍රතිකාර කිරිමට පහසු ස්ථානයකට ගැනීමට විශේෂිත පාරම්පරික වට්ටෝරු මා සතුව පවතී. අනතුරුව එම ස්ථාන ආශ්‍රිත ව සැත් යෙදීම ආදී ක්‍රම මගින් ඒවා සුව කිරීමේ හැකියාව මා සතුව පවතී. එසේම සම ඝනවීම, කලුවීම, ශෝථය ආදී ලක්ෂණ අනුව විවිධ අවස්ථා හඳුනා ගැනීම සිඳු කරයි. හකු පිළිකා, බැම පිළිකා, මස්දලු ආදී ලෙස ගෙඩි වර්ග 4448 ක් පමණ වේ.

මේ සඳහා විශේෂිත පත්තු, පැලස්තර, ගුලි, කල්ක, මැල්ලුම් ආදිය අප පරපුර සතුව පවතී. ඒ අතරින් විශේෂිත ඖෂධ වට්ටෝරු කිහිපයක් සඳහන් කිරීමට කැමැත්තෙමි.

**ගෙඩි ඉහිරීම සඳහා**

අරළු, බුළු, නෙල්ලි, වැල්මදට, රත්කිහිරිය යන මේවාට බරට බරක් සුදුහඳුන් ගෙන ගෙඩි ඉහිරවීමට සියඹලා කොළ යුෂයෙන් ද ගෙඩි පැසවීමට හාතවාරිය කොළ යුෂයෙන් ද ආලේප කරයි.

**පිළිකා වෙදකම සඳහා**

කටුපිල, වෙල්ලන්ගිරිය, අන්කෙන්ද, කෝන්තාලං, අබිං, කපුකිනිස්ස ඇට ආදිය විශේෂයෙන් ප්‍රතිකාර සඳහා භාවිතා කරයි.

**ව්‍රණ වෙදකමේ දී**

විශේෂයෙන් ඔඩු ගිය තුවාල ආදිය පිරිසිදු කර ප්‍රතිකාර කිරීම සිදුකරයි.

එහි දී විශේෂයෙන් ම තුවාල රෝපණය වීම සඳහා ගොටුකොල, මුකුණුවැන්න, මඟුල්කරඳ, අමුකහ, අත්තන, කොහොඹ කොළ මැල්ලුම් සකසා බැඳීම සිඳු කරයි.